සන්නස SANNASA

# රංගන උදුම්බරා
## නර්තන කණ්ඩායම ඉදිරිපත් කරන
# රංගාභිෂේක
# VI THE WARRIOR

2003 වසරේ ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර රංගන හා උදුම්බරා විසින් ආරම්භ කරන ලද මෙම නර්තන කණ්ඩායමට දැනට වසර 16 ක් ගත වී ඇත. අද දවසේ සෑම සති අන්තයකම සංදර්ශන ගණනාවක් පවතින මෙල්බන් නුවර රංගන උදුම්බරා නර්තන කණ්ඩායම මේ පවත්වන්නේ ඔවුන්ගේ හයවන ප්‍රසංගයයි. වසරක් පාසා ප්‍රසංගයක් පැවැත්වීම් කලාවකට වඩා එහා ගිය පරිශ්‍රමණාත්මක, කලාත්මක ප්‍රසංගයක් වේදිකාව මතට ගෙන ඒමට සෑම අවස්ථාවකම වෙර දරන නිසා ඔවුන්ගේ ප්‍රසංග නිරන්තරයෙන් මෙල්බන් වේදිකාවේ ඔබට
දකින්නට අවස්ථාවක් ලැබෙන්නේ නැත.

මෙවරද ඔවුන් උත්සාහ දරනුයේ රණ ශූරත්වය, යුධ කාමී බව, දැවැන්ත ශක්තියකින් තරුණ ගැහැණු දරුවන් යොදා ගනිමින් ඔබ වෙත අලුත්ම ආරකින් ඉදිරිපත් කිරීමටයි. මෙය ඉදිරිපත් කරන ඒ තරුණ දියණියන් මෙම නර්තන කණ්ඩායම තුළ වසර 10 සිට 16 දක්වා පුහුණුව ලබන දැරියන්ය. එම දීර්ඝ කාලීන සහයෝගය ඔවුන්ගේ ශක්‍යතාවය වර්ධනය කිරීමට ඉමහත් පිටුවහලක් වී ඇත.

සිංහල අපි රාවණා පරපුරට උරුමකම් කියන්නෝ වෙමු. සාම්ප්‍රදායික ආරම්භක නර්තන අංගයට සම්පූර්ණයෙන්ම වෙනස් අර්ථකථනයක් දෙමින් අපි මෙවර ප්‍රසංගයේ ආරම්භය ගෙන එන්නේ ඔබ සැමගේ හදවතේ රිද්මය වැඩි කරමින් එය සිංහල අපගේ ලෙයට කාවදින ආකාරයටය. නර්තන ඉතිහාසයේ මේ තාක් කිසිම නර්තන කණ්ඩායමකින් නොදුටු සමාරම්භක විදිහට ඔබ අත් විඳිනු නොඅනුමානය. විචිත්‍ර වූ නර්තන අත්දැකීම් අතර අපගේ මෙවර ප්‍රසංගයේ මාතෘකාවට නවමු අරුතක් එක් කරමින් ඉතා මෑතකදී මෙල්බන් නුවරට පැමිණ සිටින බටහිර සංගීතය පිළිබඳ උපාධිධාරී, ප්‍රායෝගික වේදිකාවේ බහුල අත්දැකීම් ලත් තරුණ සංගීතවේදී චින්ද්‍රක මධුරංග ගුණරත්නයන්, අපගේ බෙර හඬ, සංගීතය, හා නටහඬ යන මාධ්‍ය තුන එක් කරමින් නවමු අංගයක් ඔබ වෙත ගෙන එනු ඇත.

ඉන්දියාවෙන් පැමිණෙන අසුරයින්ගෙන් ලංකාද්වීපය බේරාගත හැකි වන්නේ පුළුස්ති ඉසිවරට දාව, යක්ෂ ගෝත්‍රික කාන්තාවකට පිළිසිඳගෙන පිරිමි දරුවකුට යන අභා වැකිය හැඩගුරු කරමින් අප ශ්‍රී ලංකාද්වීපයේ රාවණා උපත ලබයි. ජනශ්‍රැති වලින් තියවෙන මෙම ඉතිහාසයත්, අප සවුරුත් දන්නා ශිවපාර්වතී සහා පුවතේ අසුර යුද්ධය ජය ගැනීමට කිහිවන කාන්තාව පාර්වතී, ශිව දෙවියන්ගේ ශක්තියෙන් ශ්‍රී මහා භද්‍රකාලී මෑණියන් බවට පරිවර්තනය වී අසුර යුද්ධය ජය ගන්නා අකාරයත් මෙවර රංගාභිෂේක VI "The Warrior" ප්‍රසංගයෙන් ඔබ සැමට ගෙන එනු ලබයි.

මුලින් සඳහන් කළ පරිදි මෙම යුධ කාමී රංගනයන් ඔබ වෙත ඉදිරිපත් කරනුයේ මෙම නර්තන කණ්ඩායම් කළ එළි මංගල්‍යය ප්‍රසංගය 2014 වසරේ සම්පූර්ණ කරමින් කණ්ඩායමේ වාර්ෂික මට්ටමේ සාමාජිකාවන් හා 2018 වසරේ සිලම්බූ පැළඳීමේ මංගලයෙන් දොරට වැඩි දියණියන්ගෙන් සමන්විත විශාල පිරිසකගේ සහභාගීත්වයෙන්ය. එමෙන්ම මෙවර ප්‍රසංගයේ තවත් විශේෂත්වයක් ලෙස සඳහන් කළ හැක්කේ, උදුම්බරා වසර 1994 ශ්‍රී ලංකාවේ "සරසවි අරම" නමින් සමන්ගේම නර්තන පාසලක් ආරම්භ කරනු ලැබූවය. එදා සිට 2003 වසරේ මෙල්බන් නුවරට පැමිණෙන තුරුම ශ්‍රී ලංකාවේ ප්‍රසංග ගණනාවක් පැවැත්වූ "සරසවි අරම" නර්තන ආයතනය 2003 වසරේ සිට මෙල්බන් නුවර නැවත උපත ලබන්නේ "රංගනඋදුම්බරා" නර්තන කණ්ඩායම ලෙසය. රංගන වසර 1997 දී උදුම්බරාව හමුවන්නේ විශ්ව විද්‍යාලයේ දෙවන වසරේ ඉගෙනුම ලබන අතරදී ය. රංගන පේරාදෙණි විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වන අතර උදුම්බරා සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ උපාධිධාරිනියකි.

1997 වසරේ සිට රංගනත්, උදුම්බරාත් "සරසවි අරම" නර්තන ආයතනය පවත්වාගෙන යාමට විශාල සහයක් විය. ඒ අනුව මේ 2019 වසර රංගන උදුම්බරා යුවල දුවා දරුවන්ට නර්තන උගන්වමින් සම දායුම බෙදා හදා ගන්නා 25 වෙනි වසරයි. වසර 25 ක් නර්තන ආචාර්යවරුන් ලෙස ඔවුන් මේ ආ ගමන්මගේ දශක දෙකක් නියෝජනය කරමින් 1994 "සරසවි අරම" ප්‍රථම ශිෂ්‍යාව නර්තන විශාරද උපාධි සයුරි හා 2003, මෙල්බන් "රංගනඋදුම්බරා" නර්තන කණ්ඩායමේ ප්‍රථම ශිෂ්‍යාවක් වන අරුණි මාපා මෙම ප්‍රසංගයේ දෙවන භාගයේ "ශිව පාර්වති" Ballet අංගයේ පාර්වතී දේවිය හා බද්‍රකාලී චරිත දෙකට ජීවය ලබා දෙයි. "අපේ මේ දශක දෙකක නර්තන ආචාර්යවරුන් ලෙස සහිටුවන් කරන මොහොතේ එම දශක දෙක නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ හා මෙල්බන් නුවර මුල්ම ගෝලයන් දෙදෙනෙකු මෙම ප්‍රධාන චරිත දෙකට සම්බන්ධ කර ගැනීමට ලැබීම රංගනයන්ගේ මගේත් භාග්‍යයක් ලෙස සලකන අතර ඒ පිළිබඳ අප නිහතමානීව ආඩම්බර වන්නෙමු" උදුම්බර සඳහන් කළාය. මෙල්බන් නුවර වසර 16 ක ඉතිහාසයක් ඇති වාර්ෂිකව මට්ටම් ප්‍රධාන පෙළේ නර්තන කණ්ඩායමක් වන "රංගනඋදුම්බරා" නර්තන කණ්ඩායම ඔවුන් ප්‍රසංග, ශ්‍රී ලංකාවෙන් පැමිණෙන ගායකගායිකාවන් සංගීත කණ්ඩායම්, නළු නිළියන්ගේ ප්‍රසංග වලට අමතරව ඕස්ට්‍රේලියානු ප්‍රජාව සමඟ සම්බන්ධව ඉතා දැවැන්ත ප්‍රසංග හා නර්තන සම්මාන උළෙලක් නියෝජනය කළ එකම ශ්‍රී ලාංකීය නර්තන කණ්ඩායම ලෙස ඉතිහාසයට එක්ව ඇත. ඉන් කීපයක් සඳහන් කළොත්,

- ඕස්ට්‍රේලියානු නර්තන සම්මාන උළෙල *Melbourne Art Centre*
- පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල
- බහු වාර්ගික කොමිසම *(Multicultural Victoria)* නර්තන ප්‍රසංග
- ලෝක කුසලාන ක්‍රිකට් තරගයේ සමාරම්භක උළෙලේ ශ්‍රී ලංකාව නියෝජනය කළ නර්තනය - *Sydney My Music Bowl*

"අප දෙදෙනා නර්තන ගුරුවරුන් ලෙස වසර 25 සම්පූර්ණ මේ වසරේ එම සතුට බෙදා හදා ගන්න, ඉතාම විශේෂිත වූ ප්‍රසංගයක් දැක බලා ගැනීමට අපත් සමඟ එකතු වන මෙන් ඉතාම ආදර ගෞරවයෙන් ඔබ සැමට අප ආරාධනා කරනවා. ඒ වාගේම අපත් සමඟ මේ දීර්ඝ මාවතේ ආ ආදරණීය දියණිවරුන්ට, විශාල කැපකිරීම් කරමින් දියණිවරුන්ගේ දෙමාපියන්ට හා හැමදාමත් අපට උදව් දෙමින් ලඟ සිටින හැඳෑ හිත මිත්‍රාදීන් සියලු දෙනාට අපේ ආදර ගෞරවය පුද දෙනවා. අගෝස්තු මස 31 වන සෙනසුරාදා *Georgewood Performing Arts Centre - Ringwood* හිදී රංගාභිෂේක VI - "The Warrior" නර්තන ප්‍රසංගය වේදිකා ගත වෙයි.

Tickets
www.eventtixx.com.au

**සටහන** නර්තන විශාරද
**උදුම්බරා සංදීපනී රත්නතුංග**



